සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය – I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

උපදෙස්:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 - 40 තෙක් ප්‍රශ්නවලට **(1) (2) (3) (4)** පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
ඉංජිනේරු සංස්ථාවේ කාර්මික පුහුණු උපදේශකවරයෙක් ලෙස සේවය කර විශ්‍රාම ගත් ජයවීර ජයලත් මහතා මෝටර් රථ අළුත්වැඩියා පුහුණු පාසල ''ටෙක් වින් ඇකඩමි'' නමින් ආරම්භ කරන ලදී. ඔහුගේ ව්‍යාපාරයේ ස්වභාවය අනුව අවශ්‍ය නීතිමය ලියවිලි ඊට අදාල ආයතන වලින් ලබා ගන්නා ලදී. පුහුණු කටයුතු සඳහා අවශ්‍ය වාහන එංජින් ජපානයෙන් ආනයනය කරන ලදී.

01 ''ටෙක්වින් ඇකඩමි'' ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
(1) ඇඳුම් (2) නිවාස (3) අධ්‍යාපනය (4) ප්‍රවාහනය

02 ''ටෙක් වින් ඇකඩමි'' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(1) හවුල් ව්‍යාපාරයකි (2) කේවල ස්වාමි ව්‍යාපාරයකි
(3) සංස්ථාපිත සමාගමකි (4) සංස්ථාවකි

03 ''ටෙක් වින් ඇකඩමි'' ව්‍යාපාරය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?
(1) මෙහි ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතු නොවේ. (2) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගල භාවයක් ඇත.
(3) ජයවීර ජයලත් ගේ වගකීම සීමිත වේ. (4) මෙම ව්‍යාපාරය සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි

04 ටෙක් වින් ඇකඩමි ව්‍යාපාරයේ උප අරමුණක් නොවන්නේ,
(1) ලාභ ඉපයීමයි (2) සමාජ සුභසාධනයයි
(3) සේවක සුභ සාධනයයි (4) සේවාවල ගුණත්වය ඉහළ යෑමයි

05 ටෙක් වින් ඇකඩමියේ මෝටර් රථ එංජින් අයත් වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

06 ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචිය අයත් වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?
(1) ආර්ථික පරිසරය (2) දේශපාලන පරිසරය (3) නෛතික පරිසරය (4) තාක්ෂණික පරිසරය

07 ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයක් වන රජය මගින් ව්‍යාපාර අපේක්ෂිත දායකත්වයක් වන්නේ,
(1) ප්‍රාග්ධන දායකත්වයක් ලබා දීම (2) නිවැරදි තීරණ ගැනීම
(3) කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම (4) බදු වැනි දිරි ගැන්වීම් ලබා දීම

08 සුළං බලය භාවිත කරමින් විදුලි බලය නිපදවා ජාතික විදුලි බල පද්ධතියට එකතු කර ගැනීම රජයේ අපේක්ෂාවයි. සුළං අයිති නිෂ්පාදන සාධකය වන්නේ,
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

09 ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව හා ඔවුන්ගේ අපේක්ෂා නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න
(1) මූල්‍ය ආයතන - ගුණාත්මක නිෂ්පාදන ලබා ගැනීම (2) සැපයුම්කරුවෝ - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම
(3) තරගකරුවෝ - තව දුරටත් ණය සැපයීම (4) සේවකයෝ - ප්‍රමාණවත් ලාභයක් ලැබීම

10 ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය ඉහළ යාම අදාළ වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?
(1) ගෝලීය පරිසරය (2) ආර්ථික පරිසරය (3) තාක්ෂණික පරිසරය (4) දේශපාලන පරිසරය

11 පහත ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යාපාර කටයුතු, තාක්ෂණික පරිසර සාධක නිසා වෙනස්කම් වලට භාජනය වී ඇත.
(2) අතීතයේ පොත්වල තැබූ ගිණුම් සටහන් වර්තමානයේදී පරිගණක හා තොරතුරු පද්ධති භාවිත කර පවත්වාගෙන යයි.
(3) රටක ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමට ප්‍රධාන වශයෙන් රජය මැදිහත් වේ.
(4) විදේශ විනිමය අනුපාතය යනු ගෝලීය පරිසරයට අයත් සාධකයකි.

12 දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් වන හිතකර බලපෑමක් වන්නේ,

(1) දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම. (2) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම.

(3) විදේශ ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම. (4) දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම.

13 ඉදිකිරීම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමිත, සිය ව්‍යාපාරය පිළිබඳ පහත ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

A - ව්‍යාපාරයේ පවතින සුවිශේෂී නිෂ්පාදන ක්‍රම ව්‍යාපාරයට අවස්ථාවක් වේ.

B - පුහුණු සේවක හිඟය ව්‍යාපාරයට දුර්වලතාවයක් වේ.

C - තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම ව්‍යාපාරයට තර්ජනයකි.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A, B, C ප්‍රකාශන තුනම අසත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ

(3) A, B පමණක් සත්‍ය වේ. (4) B, C පමණක් සත්‍ය වේ.

14 ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව ලෙස හඳුන්වනුයේ,

(1) හවුල් ව්‍යාපාරය (2) සමූපකාරය

(3) සංස්ථාපිත සමාගමිය (4) සමිති ය

15 ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොවනුයේ,

(1) ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබීම (2) ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම

(3) ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම (4) ණය ලබාගැනීමේදී පහසුවක් වීම

16 සංස්ථාපිත සමාගම් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සමාගමක් සංස්ථාපනය සඳහා අදාළ ලියවිලි සම්පූර්ණ කොට පළාත් සභාවට ලබාදිය යුතුයි.

(2) සමාගමක ණය හා වෙනත් බැදීම් සම්බන්ධව කොටස්කරුවන්ගේ වගකීම සීමා රහිත වේ.

(3) සමාගමක් නීතිය ඉදිරියේ නීතිමය පුද්ගලයෙකු ලෙස නොසැලකේ.

(4) සංස්ථාපිත සමාගමකට කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස්කරගත හැක.

17 විෂ්ම පැවසුවේ ඔහුගේ පියා මුළුමනින්ම රජයේ සෘජු පාලනයට යටත් වන ආයතනයක සේවය කරන බවයි. ඔහුගේ පියාගේ රාජකාරී ස්ථානය විය හැක්කේ,

(1) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (2) ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව

(3) ශ්‍රී ලංකා වරාය අධිකාරිය (4) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

18 සමූපකාර සමිතියක් ආරම්භ කිරීමට සිටිය යුතු අවම සාමාජිකයින් ගණන වන්නේ,

(1) 20 දෙනෙකි (2) 10 දෙනෙකි (3) 15 දෙනෙකි (4) 07 දෙනෙකි

19 ස්වාධීන තීරණ ගැනීමට කැමති නෙත්මි, ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරගෙන සිටියි. ඇයට ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) හවුල් ව්‍යාපාර වේ. (2) සමූපකාර සමිති වේ.

(3) සංස්ථාපිත සමාගම් වේ. (4) තනි පුද්ගල ව්‍යාපාර වේ.

20 පළාත් සභාවක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ,

(1) පළාත් සභා ලේකම් වේ.

(2) පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා වේ.

(3) පළාත් සභාවේ ව්‍යාපාර කටයුතු අධ්‍යක්ෂ වේ.

(4) පළාත් සභාවේ වාණිජ රෙජිස්ට්‍රාර්වරයා වේ.

21 ලාභ අපේක්ෂිත මෙන්ම ලාභ අපේක්ෂා නොකරන ව්‍යාපාර සංවිධානයකට ද ගිණුම්කරණය වැදගත් වේ. ඒ අනුව ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ආයතනයේ මූල්‍ය තත්වය පිළිබඳ දැනගැනීමට

(2) නීතිමය අවශ්‍යතා ඉටුකිරීමට

(3) අනාගත සැලසුම සකස් කිරීමට

(4) ඇල්මැති පාර්ශව වලට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීමට

22 ව්‍යාපාර තුළ හටගන්නා විවිධ ගනුදෙනු හා සිදුවීම් ගිණුම්කරණයේදී සලකා බලයි. පහත දෑ අතුරින් සිදුවීමක් ලෙස සැලකිය හැක්කේ,

(1) රු. 50 000 ක බැංකු ණයක් ගැනීම.

(2) රු. 5 000 ක විදුලි බිල ගෙවීම.

(3) රු. 25 000 ක භාණ්ඩ තොගයක් විකිණීම.

(4) රු. 5000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම.

- **පහත දී ඇති තොරතුරු ඇසුරෙන් 23 හා 24 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම

B - වර්තමාන බැඳීමක් තිබීම

C - ව්‍යාපාරයට පාලනය කළ හැකිවීම

D - අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

23 වත්කම් හා වගකීම් දෙකටම පොදු ලක්ෂණය වන්නේ,

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) D පමණි

24 වත්කමක ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, C පමණි (2) A, B, D පමණි (3) A, C, D පමණි (4) B, C, D පමණි

25 පහත දී ඇති අයිතම අතුරින් ජංගම වගකීමක් වන්නේ,

(1) ණය ගැතියෝ (2) ණය හිමියෝ (3) බැංකු ණය (4) සේවක වැටුප්

26 පහත දක්වෙන්නේ ගණුදෙනුවක් නිසා ගිණුම්කරණ සමීකරණයට ඇතිවූ බලපෑමකි.

වත්කම් = හිමිකම් + වගකීම්

(-) 20 000 (-) 20000

මෙම බලපෑමට අදාළ නිවැරදි ගනුදෙනුව වන්නේ,

(1) විදුලි වියදම ගෙවීම රු. 20 000 කි. (2) ණය ගැතියන්ට ගෙවීම රු. 20 0000 කි.

(3) බැංකු ණය ගැනීම රු. 20 000 කි. (4) ණය හිමියන්ට ගෙවීම රු. 20 000 කි.

27 ''අයිතිකරු රු. 50 000 ක මුදලක් ගැනිලි කිරීම''

මෙම ගනුදෙනුවේ බලපෑම නිසා ගිණුම්කරණ සමීකරණයේ

(1) වත්කම් හා හිමිකම් අඩුවේ. (2) වත්කම් හා හිමිකම් වැඩිවේ.

(3) වගකීම් හා හිමිකම් අඩුවේ. (4) වගකීම් හා හිමිකම් වැඩිවේ.

28 2024 වර්ෂය සඳහා පහත දී ඇති තොරතුරු ඇසුරෙන් 2024/12/31 දිනට හිමිකම ගණනය කරන්න.

- වර්ෂයේ ආදායම රු. 120 000
- වර්ෂයේ වියදම රු. 90 000
- අමතර ප්‍රාග්ධනය යෙදවීම රු. 50 000
- 2024/01/01 දිනට පැවති ප්‍රාග්ධනය රු. 300 000

(1) රු. 350 000 කි (2) රු. 380 000 කි (3) රු. 420 000 කි (4) රු. 470 000 කි

29 වැඩි වීම - බැර, අඩුවීම - හර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ,

(1) වත්කම් හා ආදායම් වලට ය. (2) වගකීම් හා වියදම් වලට ය.

(3) වගකීම් හා හිමිකම් වලට ය. (4) වත්කම් හා වියදම් වලට ය.

30 පහත X හා Y තීරුවල පිළිබඳව ගිණුම් වර්ගය හා ඊට අදාළ නිදසුන් දක්වේ.

X	Y
වත්කම්	A - බැංකු ණය ගිණුම
වගකීම්	B - විදුලි ගාස්තු ගිණුම
හිමිකම්	C - මුදල් ගිණුම
වියදම්	D - ගැනිලි ගිණුම

ඉහත X තීරුවට ගැලපෙන නිදසුන නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,

(1) C, D, B, A (2) C, A, D, B

(3) C, B, D, A (4) A, B, D, C

31 පහත දක්වෙන ගිණුම් අතරින් ආදායම් ගිණුමක් වන්නේ,

(1) විකුණුම් ගිණුම (2) ගැණුම් ගිණුම

(3) මුදල් ගිණුම (4) ප්‍රාග්ධන ගිණුම

32 එක්තරා ගනුදෙනුවක් ගිණුම් ගත කර ඇති ආකාරය පහත දක්වේ.

බැංකු ණය ගිණුම - හර 10 000

මුදල් ගිණුම - බැර 10 000

එම ගනුදෙනුව නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,

(1) රු. 10 000 ක බැංකු ණයක් ගැනීම (2) රු. 10 000 ක බැංකු ණයක් ගෙවීම

(3) රු. 10 000 ක් බැංකු ගිණුමේ තැන්පත් කිරීම (4) රු. 10 000 ක් බැංකු ගිණුමෙන් ලබා ගැනීම

33 රු. 15 000 ක තොගයක් ණයට විකිණීමට අදාළ ගනුදෙනුවේ ද්විත්ව සටහන නිවැරදිව දක්වා ඇත්තේ,

(1) විකුණුම් ගිණුම හර - 15 000
ණයගැති ගිණුම- බැර 15 000

(2) ණයගැති ගිණුම හර - 15 000
විකුණුම් ගිණුම - බැර 15 000

(3) විකුණුම් ගිණුම හර - 15 000
ණයහිමි ගිණුම බැර - 15 000

(4) ණයහිමි ගිණුම හර - 15 000
විකුණුම් ගිණුම - බැර 15 000

34 ''ව්‍යාපාරයට රු. 5000 ක කොමිස් ආදායමක් ලැබීම.'' මෙය ගිණුම්ගත කිරීමට අදාළ වන නිවැරදි ද්විත්ව සටහන් රීතිය වන්නේ,

(1) වත්කම් වැඩි වීම - හර
ආදායම් වැඩිවීම - බැර

(2) මුදල් - හර
ලද කොමිස් - බැර

(3) ලද කොමිස් - හර
මුදල් - බැර

(4) වත්කම් වැඩිවීම - හර
හිමිකම් වැඩිවීම - බැර

35 මූලික සටහන් පොත්වලට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

(i) සෑම මූලික පොතක්ම ලෙජර් ගිණුම්වල පිටපත් කෙරේ.

(ii) සෑම මූලික පොතක්ම තුලනය කෙරේ.

(iii) සෑම මූලික පොතකටම මූලාශ්‍ර ලේඛන පවතියි.

මෙම තොරතුරු අනුව,

(1) (i) (ii) නිවැරදිය (iii) වැරදිය.
(2) (i) (ii) හා (iii) වැරදිය.
(3) (i) (iii) නිවැරදිය (ii) වැරදිය.
(4) (i) (ii) වැරදිය (iii) නිවැරදිය.

36 නිම්සරාගේ ව්‍යාපාරයේ 2025-01-31 දිනට බැංකු ගිණුම තුලනය කළ පසු රු. 10, 000 ක බැර ශේෂයක් ඇති විය. එය එම ව්‍යාපාරයේ,

(1) වගකීමකි.
(2) වත්කමකි.
(3) හිමිකමකි.
(4) ආදායමකි.

37 පහත ''අ'' තීරුවේ මූලික සටහන් පොත් ද (ආ) තීරුවෙහි මූලාශ්‍ර ලේඛන ද දක්වා ඇත.

(අ)	(ආ)
1. මුදල් ගිණුම	A - ඉන්වොයිසිය
2. බැංකු ගිණුම	B - ජ' නල් වවුචරය
3. ගැණුම් ජ' නලය	C - තැන්පත් කිරීමේ කුවිතාන්සිය
4. පොදු ජ'නලය	D - වවුචරය

''අ'' තීරුවේ මූලික සටහන් පොත් ''ආ'' තීරුවේ මූලාශ්‍ර ලේඛන සමග අනුපිළිවෙලින් ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) B, C, A, D
(2) D, C, B, A
(3) C, A, D, B
(4) D, C, A, B

38 විශ්ව විසින් ඔහුගේ ව්‍යාපාරයේ මුදලින් තම නිවසේ විදුලි ගාස්තුව වූ රු. 10 000 ක මුදල පියවන ලද අතර එයට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) විදුලි ගාස්තු වියදම් ගිණුම හර
විශ්වගේ ගිණුම බැර

(2) විදුලි ගාස්තු වියදම් ගිණුම හර
මුදල් පොත බැර

(3) ගැනිලි ගිණුම හර
මුදල් පොත බැර

(4) ගැනිලි ගිණුම හර
විදුලි ගාස්තු වියදම් ගිණුම බැර

39 විකුණුම් ගිණුම අයත් වන්නේ,

(1) වියදම් ගිණුමකට ය.
(2) වත්කම් ගිණුමකට ය.
(3) ආදායම් ගිණුමකට ය.
(4) වගකීම් ගිණුමකට ය.

40 අමායා විසින් රු. 7 000 ක රක්ෂණ ගාස්තුවක් චෙක්පතකින් ගෙවන ලදී. මෙයට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) රක්ෂණ ගාස්තු වියදම් ගිණුම හර 7 000
මුදල් පොත බැර 7 000

(2) රක්ෂණ ගාස්තු වියදම් ගිණුම - හර 7 000
බැංකු ගිණුම - බැර 7 000

(3) මුදල් පොත - හර 7 000
බැංකු ගිණුම - බැර 7 000

(4) මුදල් පොත - හර 7 000
රක්ෂණ ගාස්තු වියදම් ගිණුම - බැර 7 000

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II** | කාලය පැය 2 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරින් I සිට X දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ව්‍යවසායකත්වය පිලිබඳ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වනු ලැබූ පාඨමාලාවක් හදාරා ඇති චමුදිත කොන්ක්‍රීට් මල් පෝච්චි ගෙන්වා බෙදාහරින ව්‍යාපාරයක් 2025/06/01 දින ''යුනික් පොට්ස්'' නමින් ආරම්භ කරන ලදී. මේ සඳහා ඔහු තමා සතු රු. 500 000/- ක මුදලක් යෙදූ අතර ප්‍රධාන මාර්ගය අසල කුලියට ගත් ගොඩනැගිල්ලක එය ආරම්භ කරන ලදී. එදිනම 10% ක වාර්ෂික පොළියකට රු. 500 000/ - ක බැංකු ණයක් ලබා ගන්නා ලදී.

ඔහුගේ ව්‍යාපාරයේ ජුනි මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

දිනය	ගනුදෙනුව	වටිනාකම (රු.)
2025/06/05	මල් පෝච්චි මිලදී ගත්තා	60 000/-
2025/06/05	ප්‍රවාහන වියදම්	1 500/-
2025/06/10	ලී බඩු උපකරණ මිලදී ගත්තා	35 000/-
2025/06/12	මල්පෝච්චි විකුණුම්	12 000/-
2025/06/15	මල් පෝච්චි ණයට විකුණුම්	8 000/-
2025/06/20	ගොඩනැගිලි කුලී ගෙව්වා	15 000/-
2025/06/25	මල්පෝච්චි විකුණුම්	7 000/-
2025/06/27	විදුලි වියදම්	3 000/-
2025/06/29	චමුදිත සිදුකළ ගැනිලි	5 000/-

ඉදිරියේදී පැළ තවානක් පවත්වාගෙන යන සිය සොයුරිය චලනිව ද ව්‍යාපාරයට සම්බන්ධ කරගෙන ''මයි ගා(ර්)ඩන්'' නමින් නව ව්‍යාපාරයක් ඇරඹීමට චමුදිත අදහස් කරගෙන සිටියි.

(i) (අ) ''යුනික් පොට්ස්'' ව්‍යාපාරයේ දක්නට ලැබෙන නිෂ්පාදන සාධක 02 ක් දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් ලියා දක්වන්න. (ල. 02)

(ii) (අ) ''යුනික් පොට්ස් ව්‍යාපාරය'' අරමුණ අනුව හා හිමිකාරිත්වය අනුව කුමන ව්‍යාපාර සංවිධානයන්ට අයත්වේ ද?

(ආ) හිමිකාරිත්වය අනුව සැලකීමේදී මෙම ව්‍යාපාරයේ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(iii) (අ) "යුනික් පොට්ස්" ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 02)

(iv) (අ) වෘත්තීය පුහුණු අධිකාරිය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ 02 ක් ලියා දක්වන්න. (ල. 02)

(v) (අ) චමුදිත ඇරඹීමට බලාපොරොත්තු වන ''මයි ගා(ර්) ඩන්'' සඳහා සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහා බලපානු ලබන පනතක් ලියා දක්වන්න. (ල. 02)

(vi) ''යුනික් පොට්ස්'' ව්‍යාපාරයේ, බැංකු ණය ලබා ගැනීමෙන් පසු, 2025/06/01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න. (ල. 02)

(vii) (අ) 2025/ 06/15 ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(ආ) එය ගිණුම්ගත කර පෙන්වන්න. (ල. 02)

(viii)(අ) 2025/06/30 දිනට මෙම ව්‍යාපාරයේ විකුණුම් ගිණුම පෙන්වන්න.

(ආ) 2025/06/29 ගණුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 02)

(ix) (අ) මෙම ව්‍යාපාරයේ වගකීම් වැඩිවීමට හා වත්කම් වැඩිවීමට අදාළ වන ගනුදෙනුවක් ලියා දක්වන්න.

(ආ) බැංකු ණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සහිතව දක්වන්න. (ල. 02)

(x) 2025/06/30 දිනට ''යුනික් පොට්ස්'' හි මුදල් ශේෂය ගණනය කරන්න. (ල. 02)

(මුළු ලකුණු 20)

I කොටස

02. (i) (අ) ව්‍යාපාර වල පොදුවේ දැකිය හැකි අරමුණු 02 ක් ලියන්න.

(ආ) සේවාවක් යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) බැංකු ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.

(ආ) ව්‍යාපාර සඳහා යොදවන කායික හා මානසික දායකත්වය ව්‍යවසාය වේ.

(ඉ) ව්‍යාපාර කටයුතු මෙහෙයවනු ලබන්නේ කළමනාකරුවන් විසිනි.

(ඊ) අවශ්‍යතා ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැක. (ල. 02)

(iii) චමෝදි, මාදු ගඟ ආශ්‍රිතව කුරුඳු තේ නිෂ්පාදනය කර දේශීය, විදේශීය සංචාරකයන්ට අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) චමෝදිගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව 02 ක් ලියන්න.

(ආ) ඉහත එක් පාර්ශවයක් තෝරාගෙන එසේ ඇල්මක් දැක්වීමට හේතු 02 ක්ලියන්න. (ල. 02)

(iv) ගගුල් පදම් කළ හම් භාවිතයෙන් සපත්තු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) ගගුල්ගේ ව්‍යාපාරයේ සපුරාලනු ලබන මූලික අවශ්‍යතාව කුමක් ද?

(ආ) මෙහිදී යොදා ගැනෙන පදම් කළ හම් අයත්වන නිෂ්පාදන සාධකය කුමක් ද? (ල. 02)

(මුළු ලකුණු 08)

03\. (i) (අ) ව්‍යාපාර සංවිධානයක් යන්න අර්ථ දක්වන්න.

(ආ) ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි නිර්ණායක 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍යය ද යන්න දක්වන්න.

(අ) සමූපකාර රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධානයකි.

(ආ) සංස්ථාපිත සමාගම් වල අයිතිකරුවන් වන්නේ කොටස්කරුවන්ය.

(ඉ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කොට දින 14 ඇතුලත ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතුයි.

(ඊ) රජයේ මූල්‍ය නීති සංග්‍රහයට අනුව දෙපාර්තමේන්තු කටයුතු කළ යුතු නැත. (ල. 02)

(iii) (අ) විශේෂඥ වෛද්‍යවරුන් 23 දෙනෙක් එකතු වී රු. 10 000 බැගින් ප්‍රාග්ධනය යොදවා ''සුව මැදුර'' නමින් විශේෂඥ වෛද්‍ය මධ්‍යස්ථානයක් ගිවිසුමකින් තොරව ආරම්භ කර ඇත.

ඉහත සිද්ධිය තුළ කඩකර ඇති නීතින් 02 ක් සඳහන් කර ඒවායේ නීතිමය තත්ත්වය කෙටියෙන් ලියන්න. (ල. 02)

(iv) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත යුතු ඉල්ලුම් පත්‍ර 02 ක් නම් කරන්න. (ල. 02)

(මුළු ලකුණු 08)

04\. (i) හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කර උදාහරණ 01 බැගින් ලියන්න. (ල. 02)

(ii) පහත ප්‍රකාශ සත්‍යය ද, අසත්‍යය ද යන්න දක්වන්න.

(අ) රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

(ආ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයේ අයිතිය තහවුරු කරගත නොහැක.

(ඉ) සීමාසහිත සමාගමක කොටස්කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමට ආයෝජනය කළ ප්‍රාග්ධනය ට පමණක් සීමා නොවේ.

(ඊ) සමුපකාරයක් එහි ප්‍රතිපත්ති වලට සීමා වී කටයුතු කළ හැක. (ල. 02)

(iii) සීමාසහිත සඳලංකා සමාගමේ ආයෝජිත ප්‍රාග්ධනය මිලියන 20 ක් වන අතර එහි සේවයේ නියුතු සේවකයන් ගණන 34 කි.

(අ) සී/ස සඳලංකා සමාගම පරිමාණය අනුව වර්ග කිරීමට යොදා ගන්නා නිර්ණායක 02 ක් සිද්ධිය ඇසුරෙන් ලියන්න.

(ආ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව සී/ස සඳලංකා සමාගම පරිමාණය අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 02)

(iv) දෙපාර්තමේන්තුවල අයිතිය සම්පූර්ණයෙන්ම (අ) .... සතුවේ. එමගින් මහජනයාට අත්‍යවශ්‍ය වන (ආ) .... සැපයීම බොහෝ විට සිදුවේ. රජයේ වාර්ෂික (ඉ) .... මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කෙරේ. නීතිමය කටයුතු වල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සිය (ඊ) ....පෙනිසිටිය යුතුය. (ල. 02)

(මුළු ලකුණු 08)

II කොටස

05. (i) (අ) අයාල්ගේ ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

(i) ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදුවා රු. 100 000

(ii) විකිණීම සඳහා භාණ්ඩ ගත්තා රු. 20 000

(iii) බැංකුවෙන් ණය මුදලක් ලබා ගත්තා රු. 120 000

(iv) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගත්තා රු. 5 000

(v) වැටුප් ගෙව්වා රු. 20 000

(vi) රු. 10 000 ක ගොඩනැගිලි කුලී ආදායමක් ලැබුණා.

පහත වගුව භාවිත කර ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පෙන්වන්න. (i) වන ගනුදෙනුව නිදසුනක් ලෙස දක්වා ඇත.

ගනුදෙනු අංක	වත්කම් (=) රු.	හිමිකම් + (රු.)	වගකීම් (රු)
(i)	මුදල් + 100 000	ප්‍රාග්ධනය + 100 000	
(ii)	....	....	....
(iii)	....	....	....
(iv)	....	....	....
(v)	....	....	....
(vi)	....	....	....

(ල. 05)

(ආ) (i) බැංකු ගිණුමේ ද්විත්ව කාර්යයන් නම් කරන්න. (ල. 02)

(ii) නදුලගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න.

(i) රු. 100 000 ක බැංකු ණයක් ලබාගත්තා.

(ii) බඩු තොග ණයට ගැණුම් රු. 40 000

(iii) අත්පිට විකුණුම් රු. 30 000

(iv) සේවක වැටුප් ගෙව්වා රු. 15 000

(v) අමතර ප්‍රාග්ධනය යෙදුවා රු. 50 000 (ල. 05)

(මුළු ලකුණු 12)

06. (i) මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන දෙක නම් කරන්න. (ල. 02)

(ii) රු. 20 ක පෑනක් මිලදී ගැනීම.

රු. 5 000 ක බඩු තොග කමල්ගෙන් ගැනීම.

ඉහත ගනුදෙනු දෙකට අදාළ මූලික සටහන් පොත් 02 සහ මූලාශ්‍ර ලේඛන 2 නම් කරන්න. (ල.02)

(iii) දීසායුගේ ව්‍යාපාරයේ 2025 මැයි මාසයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

05/01 ප්‍රාග්ධනය ලෙස රු. 400 000 ක් යෙදුවා

05/10 බැංකුවෙන් රු. 50 000 ක ණයක් ගත්තා

05/14 බඩු තොග මිලට ගත්තා රු. 15 000

05/ 18 බැංකු ණයෙන් කොටසක් ගෙව්වා රු. 10 000

(අ) ඉහත ගනුදෙනු මුදල් පොතක සටහන් කරන්න. (ල. 04)

(ආ) එම ගනුදෙනු ලෙජරයට පිටපත් කරන්න. (ල. 04)

(මුළු ලකුණු 12)

07. (i) බැංකු ගිණුමක ගනුදෙනු ඇතුලත් කිරීමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛන 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) බැංකු අයිරාවක් යනු කුමක් ද? (ල. 02)

(iii) සාරංගගේ ව්‍යාපාරයේ බැංකු ජංගම ගිණුම ආශ්‍රිත ගනුදෙනු පහත දැක්වේ.

(අ) 2025/01/01 රු. 50 000 ක් යොදා බැංකු ජංගම ගිණුමක් ඇරඹීම

(ආ) 2025/01/10 රු. 12 000 ක සේවක වැටුප චෙක්පතක් මගින් ගෙවීම

(ඇ) 2025/01/15 රු. 16 000 ක් ණයගැතියන්ගෙන් ලැබී එදිනම බැංකු ගත කිරීම

(ඈ) 2025/01/25 රු. 18 000 ක මුදලක් බැංකුවේ තැන්පත් කිරීම.

අවශ්‍ය වන්නේ

(1) බැංකු ගිණුම පිළියෙල කර 1/31 දිනට ශේෂය සෙවීම. (ල. 04)

(2) අදාල ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම (ල. 04)

(මුළු ලකුණු 12)

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01. (3)	02. (2)	03. (4)	04. (1)	05. (3)	06. (3)	07. (4)	08. (1)	09. (2)	10. (2)
11. (4)	12. (3)	13. (2)	14. (1)	15. (1)	16. (4)	17. (1)	18. (2)	19. (4)	20. (2)
21. (4)	22. (4)	23. (1)	24. (3)	25. (2)	26. (4)	27. (1)	28. (2)	29. (3)	30. (2)
31. (1)	32. (2)	33. (2)	34. (1)	35. (3)	36. (1)	37. (4)	38. (3)	39. (3)	40. (2)

II පත්‍රය

01. (i) (අ) ව්‍යවසාය - චමුදිත
ප්‍රාග්ධනය - මුදල්, ලී බඩු උපකරණ, මල් පෝච්චි (ල. 01)

(ආ) ශක්තිය - චමුදිත හදාරා ඇති ව්‍යවසායකත්වය පිළිබඳ වූ පාඨමාලාව (ල. 01)

(ii) (අ) අරමුණ අනුව - ලාභ අරමුණු කරගත් ව්‍යාපාර හිමිකාරිත්වය අනුව - තනි පුද්ගල ව්‍යාපාර

(ආ)
- ප්‍රාග්ධනය තනි පුද්ගලයෙකු යෙදවීම
- ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම
- අයිතිකරුගේ වගකීම අසීමිත වීම
- නීතිමය පුද්ගලභාවයක් නොමැතිවීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම (ල. 02)

(iii) ඔව්
අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසා ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුය. (ල. 02)

(iv) (අ) රාජ්‍ය සංස්ථා

(ආ)
- අයිතිය හා පාලනය රජය සතු විම
- නෛතික පුද්ගල භාවයක් තිබීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම
- විශේෂ හෝ පවත්නා පොදු පනතක් යටතේ ආරම්භ කළ හැකි වීම (ල. 02)

(v) (අ) හවුල් ව්‍යාපාර

(ආ)
- සාමාජික සංඛ්‍යාව 2 - 20 ත් අතර විම
- වගකීම අසීමිත වීම
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
- හවුල් ගිවිසුමක් තිබීම
- නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම (ල. 02)

(vi) (අ)

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
500 000	=	500 000 (ප්‍රාග්ධනය)	+	-
500 000 (මුදල්)	=	-	+	500 000 (බැංකු ණය)
1 000 000	=	500 000	+	500 000

(ල. 02)

(vii) (අ) ණයගැති ගිණුම - හර 8 000
විකුණුම් ගිණුම - බැර 8 000 (ල. 01)

(ආ)

ණය ගැති ගිණුම

06/15 විකුණුම් 8 000	

විකුණුම් ගිණුම

	06/15 ණය ගැති 8 000

(ල. 01)

(viii)(අ)

විකුණුම් ගිණුම

			06/12	මුදල්	12 000
			06/15	ණයගැති	8 000
			06/25	මුදල්	7 000

(ල. 01)

(ආ) ගැනිලි ගිණුම - හර 5 000
මුදල් ගිණුම - බැර 5 000 (ල. 01)

(ix) (අ) බැංකු ණය ගැනීම රු. 500 000 (10%) (ල. 01)

(ආ) මුදල් ගිණුම හර 500 000
බැංකු ණය ගිණුම බැර 500 000 (ල. 01)

(x)

මුදල් පොත

2025			2025		
06/01	ප්‍රාග්ධනය	500 000	06/05	ගැනුම්	60 000
06/01	බැංකු ණය	500 000	06/05	ප්‍රවාහන	1 500
06/12	විකුණුම්	12 000	06/10	ලී බඩු උප.	35 000
06/25	විකුණුම්	7 000	06/20	ගොඩ. කුලී	15 000
			06/27	විදුලි වියදම්	3 000
			06/29	ගැනිලි	5 000
			06/30	ශේෂය ප/ගෙ	899 500
		1 019 000			1 019 000
07/01	ශේෂය ඉ/ගෙ	899 500			

(ල. 02)

(මුළු ලකුණු 2 x 10 = 20)

02. (i) (අ) ලාභ ඉපැයීම
පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම

(ආ) ව්‍යාපාරයක් විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් (ල. 02)

(ii) (අ) අසත්‍ය (ආ) අසත්‍ය (ඉ) සත්‍ය (ඊ) අසත්‍ය (ල. 02)

(iii) (අ) අයිතිකරු - චමෝදි
ගණුදෙනුකරුවන් - දේශීය විදේශීය සංචාරකයන්

(ආ) අයිතිකරු - ආයෝජනයේ සුරක්ෂිතතාව
ප්‍රමාණවත් ලාභ ලැබීම
ව්‍යාපාරයේ අනාගත වර්ධනය
ගණුදෙනුකරුවෝ - නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම
ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම (ල. 02)

(iv) (අ) ඇඳුම් පැළඳුම්
(ආ) ප්‍රාග්ධනය (ල. 02)

(මුළු ලකුණු 08)

03. (i) (අ) අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායම් හෝ ඒකරාශී වීම ව්‍යාපාර සංවිධානයකි. (ල. 01)

(ආ) හිමිකාරිත්වය අනුව
අරමුණ අනුව
පරිමාණය අනුව (ල. 01)

(ii) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) සත්‍ය (ඊ) අසත්‍ය (ල. ½ x4=2)

(iii) වංචා වැලැක්වීමේ ආ - රු. 1000 වඩා වැඩි ප්‍රාග්ධනයක් යොදා හවුල් ව්‍යාපාරයකි. ආරම්භ කරන්නේ නම් ලිඛිත ගිවිසුමක් යටතේ ආරම්භ කිරීම

2007 අංක 7 දරණ සමාගම් පනත

- හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජිකයින් ගණන 20 කට සීමා වීම

ව්‍යාපාර නාම ප්‍රඥප්තිය

හවුල් කරුවන්ගේ නම් වලින් හැර වෙනත් නාමයකින් පවත්වාගෙන යන්නේ නම් ලියා තැබීම අනිවාර්ය වේ.

(කරුණු 02 ලකුණු 01)

(පැහැදිලි කිරීමට ලකුණු 01)

(iv) ඒක පුද්ගල ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය, ව්‍යාපාර නාම ලියාපදිංචිය කිරීම සඳහා අවශ්‍ය වන ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය (ල. 02x01=2)

(මුළු ලකුණු 08)

04. (i)

ව්‍යාපාර සංවිධාන

පෞද්ගලික
උදා : තනි පුද්ගල
හවුල්
සමුපකාර
සමාගම්

පොදු / රාජ්‍ය
රාජ්‍ය සංස්ථා
රාජ්‍ය දෙපාර්තමේන්තු
රාජ්‍ය සමාගම්

වර්ග කිරීමට ලකුණු 01

උදාහරණ 02 ට ලකුණු 01

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය (ල. ½ x4=2)

(iii) (අ) ආයෝජිත ප්‍රාග්ධනය

සේවකයන් සංඛ්‍යාව (ල. ½ x2=1)

(ආ) මහා පරිමාණ ව්‍යාපාර සංවිධානයකි .(ල. 01)

(iv) (අ) රජය (ල. 01)

(ආ) පොදු සේවා / සේවා

(ඉ) අය වැය ලේඛනය

(ඊ) නිල නාමය (ල. ½ x4=2)

(මුළු ලකුණු 12)

05. (i) (අ)

ගනුදෙනු අංක	වත්කම් =	හිමිකම් +	වගකීම්
(i)	පිළිතුර දී ඇත		
(ii)	+ බඩු තොග 20 000 - මුදල් 20 000		
(iii)	+ මුදල් 120 000		+ බැංකු ණය 120 000
(iv)	- මුදල් 5 000	ගැනිලි 5 000	
(v)	- මුදල් 20 000	- වැටුප් වියදම් 20 000	
(vi)	+ මුදල් 10 000	+ ගොඩනැගිලි කුලී ආදායම 1 0000	

(ල. 05)

(ආ) (i) මූලික සටහන් පොතක කාර්යය

ලෙජර් ගිණුමක කාර්යය (ල. 02)

(ii) (i) මුදල් පොත හර 100 000

බැංකු ණය බැර 100 000

(ii) ගැණුම්/ බඩු තොග හර 40 000

ණයහිමියෝ බැර 40 000

(iii) මුදල් පොත හර 30 000

විකුණුම් ගිණුම බැර 30 000

(iv) සේවක වැටුප් හර 15 000
මුදල් පොත බැර 15 000

(v) මුදල් පොත හර 50 000
ප්‍රාග්ධනය බැර 50 000 (ල. 05)

(මුළු ලකුණු 12)

06. (i) ලදුපත, ගෙවීම් වවුරය (වවුචරය) (ල. 02)

(ii) සුළු මුදල් පොත - සුළු මුදල් ගෙවීම් වවුචරය
ගැනුම් ජ'නලය - ගැනුම් ඉන්වොයිසිය (ල. 02)

මුදල් පොත

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
05/01	ප්‍රාග්ධනය		400 000	05/14	ගැණුම්		15 000
05/10	බැංකු ණය		50 000	05/18	බැංකු ණය		10 000

(ල. 04)

ප්‍රාග්ධන ගිණුම

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
				05/01	මුදල්		400 000

බැංකු ණය ගිණුම

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
05/18	මුදල්		10 000	05/10	මුදල්		50 000

ගැණුම්

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
05/14	මුදල්		15 000				

(ල. 04)

(මුළු ල. 12)

07. (i) තැන්පත් කිරීමේ කුවිතාන්සිය, ගෙවීම් වවුචරය, බැංකු ප්‍රකාශනය, අගරු චෙක් නිවේදනය, චෙක් පිළපත (ල. 02)

(ii) ජංගම ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කල විට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම නිසා ජංගම ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගයයි (ල. 02)

බැංකු ගිණුම (ල. ½)

දිනය	විස්තරය	ස.පි.	වටිනාකම	දිනය	විස්තරය	ස.පි.	වටිනාකම
01/01	මුදල්		50 000	01/12	වැටුප්		12 000
01/15	ණය ගැති		16 000				
01/25	මුදල්		18 000				
					ප/ගෙ /ශේෂය		72 000
			84 000				84 000
	ඉ/ගෙ/ශේ		72 000				

(ල. 04)

මුදල් පොත

	01/01 බැංකු 50 000
	01/25 බැංකු 18 000

වැටුප්

01/12 බැංකු 12 000	

ණයගැති

	01/15 බැංකු 16 000

(ල. 04)

(මුළු ලකුණු 12)